**හපුතලේ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශ**

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ශුද්ධ වත්කම්වල අඩුවීම**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම්වල වටිනාකම රු.40,741,677 ක් වූ අතර ඉකුත් වර්ෂය අවසානයට ශුද්ධ වත්කම්වල වටිනාකම රු.43,942,741 ක් වූයෙන් එහි ශුද්ධ අඩුවීම රු.3,201,064 ක් විය.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, ලැබිය යුතු උසාවි දඩ ලෙස ආදායම් ණයගැතියන් යටතේ ගිණුම්ගත නොකළ රු.3,113,744 ක් සමාලෝචිත වර්ෂය තුල ලැබීමේ දී සමුච්චිත අරමුදල් ගිණුමට බැරකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබුණි.

(ආ) සභාව සතු අංක 53-5067 දරන කැබ් රථයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 **නොසැසඳූ පාලන ගිණුම්**

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුම් ශේෂය, තැන්පත් ලේඛණය සමඟ සැසඳීමේ දී රු.124,364 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 12,124,398 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.29,870,702 ක් විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

රු.43,312,500 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් පැවරුම් නියෝග, හිමිකම් ඔප්පු හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොවීම නිසා එම විෂයයන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් පනත | අනියම් හා ආදේශක සේවකයින් 11 දෙනෙකු වෙනුවෙන් 2013 වර්ෂයට අදාලව සේවා නියුක්තයින්ගේ භාර අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු 3% දායක මුදල වූ රු.32,973 ක් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 1985 අංක 01 දරන පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත | අනියම් හා ආදේශක සේවකයින් 11 දෙනෙකුගේ (සංශෝධිත) වැටුපෙන් අයකල යුතු 8% ක දායක මුදල අයකර ගෙන නොතිබූ අතර 2013 වර්ෂයට අදාලව සේවක අර්ථ සාධක අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු සභාවේ දායකය 12% ඇතුළු 20% ක දායක මුදල වූ රු. 219,823 ක් එම අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) 217 හා 218 | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියලුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කරවීමට සභාපතිවරයා විසින් කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැර ගිය, සේවකයින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.54,562 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,636,694 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,516,943 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු.6,880,249 ක් විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,880,249 ක ශුද්ධ අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 534,622 | 586,586 | (51,964) |
| බදු කුලී | 8,048,150 | 17,979,632 | (9,931,482) |
| බලපත්‍ර ගාස්තු | 492,570 | 401,682 | 90,888 |
| සේවා සඳහා ගාස්තු | 2,541,391 | 4,210,778 | (1,669,387) |
| වරෙන්තු ගාස්තු හා දඩ | 8,613,655 | 3,231,483 | 5,382,172 |
| වෙනත් ආදායම් | 332,873 | 493,033 | (160,160) |
| ආදායම් ආධාර | 13,093,261 | 11,059,333 | 2,033,928 |
| | | | |
| **පුනරාවර්තන වියදම** | | | |
| වැටුප් හා දීමනා | 17,284,304 | 14,577,342 | (2,706,962) |
| ගමන් වියදම් | 549,095 | 659,718 | 110,623 |
| සැපයුම් හා උපකරණ | 1,976,896 | 2,108,375 | 131,479 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,083,012 | 1,668,794 | 585,782 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 2,152,928 | 2,231,112 | 78,184 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 766,478 | 609,787 | (156,691) |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 3,079,637 | 2,406,820 | (672,817) |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 127,478 | 183,636 | 56,158 |
| | | ශුද්ධ අඩුවීම | (6,880,249) |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ ආදායම රු.20,563,261 ක් වූ අතර වර්ෂය අවසානයට හිඟ ආදායම රු.5,723,661 ක් විය. එය බිල්කළ ආදායමින් සියයට 27 ක් විය.

### 2.3.2 වරිපනම් බදු

සභා බල ප්‍රදේශය තුල පිහිටි වරිපනම් බදු අයකළ හැකි දේපල, 2004 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි.

2.3.3 **බදු කුලී**

--------

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු කඩ කාමර 39 ක් සඳහා මාසික බදු කුලී, ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ තක්සේරුකරුවකු මඟින් තක්සේරු කරවාගෙන නොතිබුණි.

2.3.4 **බලපත්‍ර ගාස්තු**

---------------

ඉකුත් පෙර වර්ෂය අවසානයට අයවිය යුතුව පැවති රු.52,525 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟයෙන් වර්ෂය අවසාන වන විට අයවී තිබුනේ රු.1,450 කි. එනම් සියයට 2.7 කි.

2.3.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | |
|---|---|
| | රු. |
| උසාවි දඩ | 3,658,109 |
| මුද්දර ගාස්තු | 1,463,790 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

සභා බල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු 08 ක් ස්ථාපිත කර තිබූ නමුත්, සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **නිෂ්කාර්ය වත්කම්**

-------------------

සභාව සතු මිට්ෂුබිෂි වර්ගයේ කැබ් රථ 02 ක් සහ අත්ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර නිශ්කාර්යව සභා භූමියේ රඳවා තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

**අයවැය පාලනය**

-----------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛණය සමඟ තථ්‍ය දත්තයන් සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වන බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

| පුනරාවර්තන ආදායම | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් හා බදු | 633,500 | 534,622 | 98,878 | 15.6 |
| කුලී | 3,941,700 | 8,048,150 | 4,106,450 | 104.1 |
| බලපත්‍ර ගාස්තු | 472,300 | 492,570 | 20,270 | 4.2 |

| | | | | |
|---|---|---|---|---|
| සේවා සඳහා ගාස්තු | 3,396,000 | 2,541,391 | 854,609 | 25.1 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 6,038,000 | 8,613,655 | 2,575,655 | 42.6 |
| වෙනත් ආදායම් | 400,600 | 332,873 | 67,727 | 16.9 |
| ආදායම් ආධාර | 13,237,550 | 13,093,261 | 144,289 | 1.0 |
| ප්‍රාග්ධන ආධාර | 3,500,000 | 10,103,563 | 6,603,563 | 188.6 |

පුනරාවර්තන වියදම්
---------------------

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් හා වේතන | 15,951,570 | 17,284,304 | 1,332,734 | 8.3 |
| ගමන් වියදම් | 705,000 | 549,094 | 155,906 | 22.1 |
| සැපයුම් හා උපකරණ | 1,911,500 | 1,976,895 | 65,395 | 3.4 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,428,000 | 1,083,012 | 344,988 | 24.1 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 1,822,500 | 2,152,928 | 330,428 | 18.1 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 970,000 | 766,478 | 203,522 | 20.3 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 80,000 | 3,079,637 | 2,999,637 | 3749.5 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 275,000 | 127,478 | 147,522 | 53.6 |
| ප්‍රාග්ධන වියදම් | 6,950,000 | 24,034,579 | 17,084,579 | 245.8 |

5. **පද්ධති හා පාලන**
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) ආදායම් පරිපාලනය